**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2022**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.21,260,122 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් පාවිච්චි කරනු ලබන වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කර නොතිබුණි. | වාහන තක්සේරු කිරීම අවසන්ව ඇති අතර අදාළ ගැලපීම් 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සිදු කරනු ඇත. අනෙකුත් වත්කම් ඉදිරියේදී තක්සේරු කළ පසු අදාළ ගැලපීම් සිදු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළයුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව ආයතන 11 ක් විසින් භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වා ඉන්වොයිස් ඉදිරිපත් කර තිබියදී ගෙවියයුතු රු.37,395,922 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් කර නොතිබුණි. | මේ සඳහා මහා භාණ්ඩාගාරයේ මුදල් නොලැබුනු අතර, අදාළ ආයතනවලින් ඒ වන විට තහවුරු කරන ලද බිල්පත් නොලැබී තිබූ බැවින් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල ඇතුළත් කර නැත. මෙම සිදුවීම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් සිදු වීමක් බැවින් ගිණුම්කරණ සටහනක් මඟින් දක්වා ඇත. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.2,290,285 ක්, වර්ෂ 03කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් | අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා රාජ්‍ය භාෂා සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ පිළිබඳ එවකට පැවැති | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කිරීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි. | අමාත්‍යාංශය වෙත කිහිප අවස්ථාවකදීම දැනුම් දී ඇත. ඊට අමතරව දැනට ආයතනය අයත් රේඛීය අමාත්‍යාංශය වෙත ද මේ සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කර ඇත. | |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගුවන් විදුලි වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු රු.2,500,676 ක් හා රූපවාහිනී වැඩසටහන් සඳහා ආසක් මීඩියා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු රු.458,820 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි. | ආයතනයට වෙන් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට අදාළ මුදල් මහභාණ්ඩාගාරයෙන් නිදහස් නොකිරීම මත මෙම ශේෂය තව දුරටත් ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම්වල පෙන්නුම් කෙරේ. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සම්පත් දායකයන්ට ගෙවිය යුතුව පැවති රු.2,449,985 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | ප්‍රතිපාදන සලසාගෙන වියදම් දැරිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 03වන පරිච්ජේදයේ 3.2(V) ඡේදය | රජය සතු ව්‍යවසායන් දිරිදීමනා ගෙවීමේදී දිරිදීමනා යෝජනා ක්‍රමයක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමත කර ගත යුතු වුවද එකී උපදෙස් වලට අනුගත නොවී සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන්ට රු.675,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | 140.08 දරන කළමණාකරණ මණ්ඩල අනුමැතිය මත මෙම දිරි දීමනාව ගෙවීම් කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | රජයේ ආයතන මඟින් ගොඩනැගිලි කුලියට ගැනීම නැවැත්විය යුතු වුවද ආයතනය පවත්වාගෙන යනු ලබන කුලී ගොඩනැගිල්ල සඳහා 2023 පෙබරවාරි 13 වන දින දක්වා රු.1,350,000 ක මාසික කුලියකට ගිවිසුම් ගත වී වර්තමානය වන විටත් එම ගොඩනැගිල්ලේම ආයතනය ස්ථාපිත කර තිබුණි. | ආයතනය පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් සොයා ගැනීමට නොහැකි වූ බැවින් දැනට භාවිතා කරන ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 47,590,386 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 13,849,436 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 61,439,822 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පුහුණු පාඨමාලා ආදායම රු.80,864,525 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුහුණු පාඨමාලා පැවැත්වීමට රාජ්‍ය භාෂා විෂය භාර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මෙම ආයතනය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව තිබියදී කළමනාකරණ තීරණයක් මත නිල භාෂා හා වෘත්තීය අධ්‍යාපන ආයතනය විසින් පාඨමාලා 89 ක් ද ඒ.අයි.එම්.එස්. අධ්‍යාපන සේවා පෞද්ගලික සමාගම විසින් පාඨමාලා 03 ක් ද සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි. | 2007 අංක 26 දරණ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ (ඇ) ප්‍රකාරව ආයතනයේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ආයතන මඟින් අදාළ පාඨමාලා පවත්වා ඇත. | ආයතනය සතු සම්පත් උපයෝජනයට ගනිමින් පුහුණු පාඨමාලා පැවැත්වීම ආයතනය විසින්ම කළ යුතුය. |